# කාර්යසාධන වාර්තාව
# செயலாற்றல் அறிக்கை
# PERFORMANCE REPORT 2022




## මහා භාරකාර දෙපාර්තමේන්තුව
## பொது நம்பிக்கைப் பொறுப்பாளர் திணைக்களம்
## DEPARTMENT OF PUBLIC TRUSTEE



# 2022

## කාර්යසාධන වාර්තාව
## செயலாற்றல் அறிக்கை
# PERFORMANCE REPORT

මහා භාරකාර දෙපාර්තමේන්තුව
**பொதுநம்பிக்கைப் பொறுப்பாளர்திணைக்களம்**
Department of Public Trustee

# 2022.12.31 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

## ආයතනයේනම - මහා භාරකාර දෙපාර්තමේන්තුව

## වැය ශීර්ෂ අංකය - 205

**අන්තර්ගතය**


පරිච්ඡේදය01 - ආයතනිකපැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

පරිච්ඡේදය 02 – ප්‍රගතිය හා ඉදිරි දැක්ම

පරිච්ඡේදය 03 - වසරේ සමස්ථ මූල්‍ය කාර්ය සාධනය

පරිච්ඡේදය 04 – කාර්ය සාධන දර්ශක

පරිච්ඡේදය 05- තිරසාර සංවර්ධනඅරමුණු (SDG)සපුරා ගැනීමේ කාර්යසාධනය

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

පරිච්ඡේදය 07– අනුකූලතා වාර්තාව

## 01 පරිච්ඡේදය - ආයතනිකපැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

### 1.1.හැඳින්වීම

**<u>මහා භාරකාරධුරය සහ නෛතික ශක්නුතාවය.</u>**

1931 අංක 11 සහ 1938 අංක 59 දරණ අඥා පනත් මඟින් ද, 1973 අංක 44 සහ 1975 අංක 25 දරණ නීති මඟින්ද, 1983 අංක 41 සහ 1988 අංක 61 දරණ පනත් මඟින් සංශෝධිත 1922 අංක 01 දරණ මහා භාරකාර ආඥා පනත මඟින් ශ්‍රී ලංකාව තුළ මහා භාරකාර ධූරය, ස්වාධීන අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් සහිතව ස්ථාපිත කොට ඇති අතර, ධූරයේ නාමයෙන් නඩු පැවරීමට සහ පවරනු ලැබීමට නෛතික ශක්නුතාවයක් සහිත වේ.

**<u>නෛතික පසුබිම</u>**

ශ්‍රී ලංකාව තුළ මහා භාරකාර ධූරය ස්වාධීන හා අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් සහිතව ස්වාධීන කොට ඇති අතර නාමයෙන් ස්වාධීන නෛතික පුද්ගලයෙක් ලෙස ස්ථාපිත කර ඇත. ඒ අනුව මහා භාරකාර ධූරය හා ආයතනය අදාළ ආඥා පනත් අනුව පාලනය වේ.

1. 1931 අංක 11 සහ 1938 අංක 59 දරණ ආඥා පනත් මඟින් ද 1973 අංක 44 සහ 1975 අංක 25 දරණ නීති මඟින්ද 1983 අංක 41 සහ 1988 අංක 61 දරණ පනත් මඟින් සංශෝධිත 1922 අංක 1 දරණ මහා භාරකාර ආඥා පනත
2. 1938 අංක 04, 1934 අංක 11 දරණ ආඥා පනත් මඟින්ද 1968 අංක 7 සහ 1971 අංක 30 දරණ පනත් මඟින් ද සංශෝධිත 1917 අංක 9 දරණ භාර ආඥා පනත බල පැවැත්වෙන අතර එකී පණත නිහඩවන්නා වූ යම් අවස්ථාවකදී ඉංග්‍රීසි නීතියේ ඇති සමානාත්මතා මූලධර්මය (LAW OF EQUITY)
3. මීට අමතරව සිවිල් නඩු විධාන සංග්‍රහය, අධිකරණ සංවිධාන පනත සහ වෙනත් ලිඛිත නීති මඟින් මහා භාරකාර තැන වෙත කාර්ය භාරයන් පැවරී ඇත.
4. මහා භාරකාර ආඥා පනතට පසුව කරන ලද සංශෝධනයන් අනුව සහ වෙනත් ලිඛිත නීති අනුව මහා භාරකාරතැන වෙත පහත කාර්යයන්ද පැවරී ඇත.
    - 1988 අංක 61 දරණ පනත මඟින් සංශෝධිත මහා භාරකාර ආඥා පනතේ 10 (අ) වගන්තියට ප්‍රකාරව සේවා නියුක්තිය සඳහා විදේශගතවන්නන්, විදේශයකදී මිය ගියහොත් ඔවුන් වෙනුවෙන් ලැබෙන වන්දි මුදල් යැපෙන්නන් / නීත්‍යානුකූල උරුමකරුවන් අතර බෙදාදීම සහ සේවා නියුක්තිය සඳහා ශ්‍රී ලංකාවෙන් බැහැරයන ශ්‍රී ලාංකික පුරවැසියන් සේවා නියුක්තියෙහි යෙදී සිටියදී මරණයට පත් වූ අවස්ථාවක යම් වන්දි මුදලක් ගෙවනු ලැබිය යුතු තැනැත්තන්ගේ නම් මහා භාරකාරවරයා වෙත ලියාපදිංචි කරවා ගැනීම.
    - 1944අංක 28 දරණ විභාර වන්දි ආඥා පනත ක්‍රියාත්මක කිරීම.
    - 1981 අංක 42 දරණ පනතින් සංශෝධිත 1931 අංක 19 දරණ බෞද්ධ විභාර දේවාලගම් ආඥා පනත යටතේ පැවරී ඇති කාර්යයන් ඉටු කිරීම.
    - 1973 අංක 28 දරණ විශේෂ විධිවිධාන පනත යටතේ එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම සමාගමේ කොටස්වල භාරකාරත්වය රජය වෙනුවෙන් දැරීම.

**1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර**

**<u>දැක්ම</u>**

1922 අංක 01 දරන මහා භාරකාර ආඥා පනතේ සහ 1917 අංක 09 දරන භාර ආඥා පනතේ ප්‍රතිපාදන වලට අනුකූලව, ශ්‍රී ලංකා ජනරජය තුල වලංගුව පවතින නෛතික රාමුව යටතේ, විශ්වාසනීයත්වයෙන්, අපක්ෂපාතීත්වයෙන් සහ විනිවිදභාවයෙන් යුක්තව, ශ්‍රී ලංකාවේ මහා භාරකාර තුමා සහ ඔහුගේ කාර්ය මණ්ඩලය සද්භාවයෙන් ස්වකීය වෘත්තීමය වගකීම් සහ යුතුකම් සපුරා ඉටු කිරීම.

**<u>මෙහෙවර</u>**

ශ්‍රී ලංකාවේ මහා භාරකාර තැන සහ මහා භාරකාර දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති සියලුම බලතල සහ වගකීම් නෛතික රාමුව තුල විනිවිදභාවයෙන් යුක්තව ක්‍රියාත්මක කිරීම සහ මහා භාරකාර දෙපාර්තමේන්තුව වෙත විශ්වාසය තබමින් සේවාවන් ලබා ගැනීම සඳහා පැමිණෙන පාර්ශවයන්ට අපක්ෂපාතීව හා කාර්යක්ෂමව උපරිම සේවයක් විනිවිදභාවයෙන් යුක්තව ලබාදීම සහ ඒ තුළින් ශ්‍රී ලංකා මහා භාරකාර දෙපාර්තමේන්තුවේ දේශීය මෙන්ම ජාත්‍යන්තරයේ ද කීර්තිනාමය වර්ධනය වන සහ පැසසුමට ලක් වන ආකාරයට කටයුතු කිරීම.

**1.3ප්‍රධාන කාර්යයන්**

**<u>මහා භාරකාරතැනගේ බලතල සහ කාර්යභාරය.</u>**

මහා භාරකාර ආඥා පනත, සිවිල් නඩු විධාන සංග්‍රහය, අධිකරණ සංවිධාන පනත සහ වෙනත් ලිඛිත නීති මත පහත කාර්යභාරයන් මහා භාරකාර තැන වෙත පැවරී ඇත.

- සමාන්‍ය භාරකරුවකු ලෙස කටයුතු කිරීම.
- රැකවරණ භාරකරුවකු හෝ ආරක්ෂක භාරකරුවකු ලෙස කටයුතු කිරීම.
- දේපළ රැස්කිරීමේ නියෝග යටතේ දේපළ රැස්කරන්නෙකු ලෙස කටයුතු කිරීම.
- බාලවයස්කරුවකුගේ දෙපළ භාරකරු හෝ සහය මිත්‍රයා (ආරක්ෂක කළමනාකරුවකු) ලෙස කටයුතු කිරීම.(දිසා අධිකරණ මඟින් පවරන ලද අවස්ථාවක)
- සිහි විකල් පුද්ගලයෙකුගේ දේපල කළමනාකරුවකු ලෙස කටයුතු කිරීම.(දිසා අධිකරණ මඟින් පවරන ලද අවස්ථාවක)
- නිශ්චල දේපළ ගිවිසුම්ගත කළමනාකරුවෙකු ලෙස කටයුතු කිරීම. (ආරක්ෂක භාරකරුවකු ලෙස පෙනී සිටින අවස්ථාවලදී එම භාරයන් හි පත්කර ඇති භාරකාර මණ්ඩලය මඟින් කලින් කලට ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීමට පමණක් ආරක්ෂක භාරකරු බැඳී සිටී.)
- විදේශගත වූ ශ්‍රී ලාංකිකයකුගේ ඇටර්නි බලකරු ලෙස ඔවුන්ට අයවිය යුතු මුදල් ලබාදීම හෝ ගෙවීම සඳහා කටයුතු කිරීම.
- සිවිල් නඩුවිධාන සංග්‍රහය පනතේ ප්‍රතිපාදන යටතේ ගරු අධිකරණය මඟින් නියෝග කරන ලද දේපළ සම්බන්ධව සහ අනෙකුත් කරුණු සම්බන්ධව කටයුතු කිරීම.
- ගරු අධිකරණය මඟින් පවරන අවස්ථාවලදී අන්තිම කැමතිපත්‍රයක් රහිත පුද්ගලයෙකුගේ අද්මිනිස්ත්‍රාසිකරුවකු ලෙස කටයුතු කිරීම.
- වරදට සිරගතවූවකු දේපළ කළමනාකරුවෙකු ලෙස කටයුතු කිරීම.
- ඕනෑම පුද්ගලයෙකුගේ අන්තිම කැමති පත්‍රයක් සුරක්ෂිතව තැන්පත් කර තබාගන්නකු ලෙස කටයුතු කිරීම.

**මහා භාරකාර දෙපාර්තමේන්තුව මගින් පාලනය වන භාර සහ බුදල් සංඛ්‍යාව**

2022.12.31 දිනට දෙපාර්තමේන්තුව මගින් පාලනය වන භාර සංඛ්‍යාව1133 ක් වන අතර බුදල් සංඛ්‍යාව171 කි.

**මහාභාරකාර දෙපාර්තමේන්තුවෙන් සැලසෙන සේවාවන්.**

මෙම දෙපාර්තමේන්තුවෙහි පිහිටුවා ඇති භාරවල අරමුණු අනුව / අන්තිම කැමති පත්‍රවල ඇති අරමුණු අනුව / අධිකරණ නියෝග මත විෂයයන්හි කටයුතු කරමින් ජනතාවට සේවය සපයනු ලබයි.

- අධ්‍යාපනය හදාරන මූල්‍යමය අතින් ඉතාමත්දුෂ්කරතා ඇති දරුවන් දිරිමත් කිරීම සඳහා ශිෂ්‍යත්ව ලබාදීම.
- අසරණ සහ හදිසි ප්‍රතිකාරඅවශ්‍ය රෝගීන් ට වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම සඳහා වෛද්‍ය ආධාර ලබාදීම.
- ආගමික සිද්ධස්ථාන නඩත්තු කිරීම හා සංවර්ධනය කිරීම සඳහා පිහිටුවා ඇති භාරවලඅරමුණු අනුව මූල්‍ය මූල්‍යාධාර සැපයීම.
- පුණ්‍යාධාර කටයුතු
- විවිධ හේතූන් නිසා ජීවත්වීමට අපහසු අසරණ පුද්ගලයන්ට සහඑවැනි පුද්ගලයන් සිටින ආයතනවලට ආධාර කිරීම.
- භාර/බුදල් මුදල් දේපළ කළමනාකරණය කිරීම.
- විහාර දේවාලගම් පනත යටතේ රජයට පවරා ගන්නා ලද නිශ්චල දේපල සඳහා හිමිවන වන්දි මුදල්, බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්වරයාගේ නිර්දේශ මත බෙදාහැරීම
- සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමෙහි කොටස්වල භාරකාරත්වය රජය වෙනුවෙන් දරමින් එම සමාගමේ කටයුතු මෙහෙයවීම හා අධීක්ෂණය
- විදේශවන්දි ලෙස ලැබෙන මුදල්යැපෙන්නන් හෝ නීත්‍යානුකූල උරුමකරුවන් අතර බෙදා දීම.
- රාජ්‍ය ආයතනයක් වශයෙන් උපයන ආදායමින් ප්‍රතිශතයක් මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීම.

ඉහත කාර්ය භාරය ඉටු කිරීම සඳහා දෙපාර්තමේන්තුව තුල පහත අංශ ස්ථාපිත කර ඇත.

1. ආගමික අංශය
2. වෛද්‍යාධාර අංශය
3. ශිෂ්‍යාධාර අංශය
4. පුද්ගල භාර අංශය
5. විමර්ශන අංශය
6. වතු අංශය
7. ගිණුම් අංශය
8. පාලන අංශය
9. විහාර වන්දි අංශය
10. විදේශ වන්දි අංශය
11. අභ්‍යන්තර විගණන අංශය

# සංවිධාන සටහන - මහා භාරකාර දෙපාර්තමේන්තුව



**පරිච්ඡේදය 02 – ප්‍රගතිය හා ඉදිරි දැක්ම**

**විශේෂ ජයග්‍රහන , අභියෝග හා ඉදිරි ඉලක්ක**

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිරීක්ෂණ**

මෙම දෙපාර්තමේන්තුව මඟින් භාර දේපල පරිපාලනයහා භාර වල අරමුණු ඉටු කිරීම සිදු කෙරේ. ඒ අනුව ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබන්නේ භාර අරමුදල් මඟින් වේ.

## 2.1 වතු පරිපාලනය

මෙම දෙපාර්තමේන්තුව සතුව ප්‍රධාන වතු 9 ක් හා ලබුගේනවත්ත නමින් ආරක්ෂක භාරකරුවකු ලෙස කටයුතු කරන වත්තක් ද පවතී. එමෙන්ම එන්.ඩී.ඒ. ද සිල්වා විජේසිංහ බුදලයට අයත් රිච්මන්ඩ් කාසල් මන්දිරයේ පරිපාලනය ද එහි ළමා නිවාසයේ පරිපාලනයද දෙපාර්තමේන්තුව මඟින් සිදු කෙරේ.

මෙම වතු ආශ්‍රිතව ප්‍රධාන බෝග ලෙස වී, පොල්හා තේ වගාවන් පවතින අතර ඊට අමතරව ගම්මිරිස්, මැංගුස්, රඹුටන්, කුරුඳු හා කෙසෙල් සුළු ප්‍රමාණයක් පවතී. සමහර වතු අලාභදායී තත්ත්වයේ පවතින අතර ඒවා ලාභදායී තත්ත්වට පත් කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.



## 2.2 දේපල පරිපාලනය

උසාවි නියෝග මත හෝ අන්තිම කැමති පත්‍ර මඟින් පවරන ලද නිවාස හා වෙනත් දේපළ මෙම දෙපාර්තමේන්තුව සතුව පවතී. එම දේපල වලින් ලැබෙන ආදායමෙන් එහි හිමිකරුවන්ගේ අරමුණු ඉටු කිරීම සිදුවේ. මේ යටතට පුණ්‍යාධාර ගෙවීම හෝ ඔවුන්ගේ භාරකරුවන් රැකබලා ගැනීම ආදී කටයුතු ඇතුළත් වේ.

## 2.3 භාර ආධාර වැඩසටහන්

මේ යටතේ ආගමික, පුද්ගලභාර, වෛද්‍යාධාර හාශිෂ්‍යාධාර ලෙස ආධාර ක්‍රම ක්‍රියාත්මක වේ.

### ආගමිකආධාර

අන්තිම කැමති පත්‍රය සහ භාර ඔප්පුවල ඇති අරමුණු පරිදි ආගමික සිද්ධස්ථාන සහ ආගමික ස්වරූපයේ ආයතනයන්ට නීත්‍යානුකූලව ගිවිසුම් ප්‍රකාරව ගෙවීම් කිරීම සහ ආධාර ලබා දීම මේ යටතේ සිදුකරයි.

### පුද්ගලභාරආධාර

දෙපාර්තමේන්තුවේ පිහිටුවා ඇති භාර හා අන්තිම කැමති පත්‍ර වලින් මහා භාරකාරතැන පොල්මංකරු වශයෙන් පත් කර ඇති බුදල් අතරින් අර්ථලාභියා නිශ්චිතව සඳහන් කර ඇති භාර හා බුදල් වලට අදාල අරමුණු ඉටු කිරීමට ද පොදු අරමුණක් නොවන පුද්ගලික අරමුණු මුල් කර ගනිමින් ඇති කල භාර වේ. ඒ අනුව ගෙවීම් සිදු කෙරේ.

### වෛද්‍යාධාර

අන්තිම කැමති පත්‍ර සහ භාරයන්හි අරමුණු ප්‍රකාරව රෝහල් වෙත හා රෝගී පුද්ලයන් වෙත මූල්‍ය පහසුකම් හා වෛද්‍යාධාර ලබා දීම සිදුවේ. අයදුම්පත්‍ර කැඳවීම මඟින් ප්‍රතිලාභීන් තෝරා ගැනීම සිදු කරයි.

### ශිෂ්‍යාධාර

භාරයේ අවසන් කැමති පත්‍රයේ ප්‍රධාන අරමුණ ශිෂ්‍යාධාර ලබා දීම ලෙස සඳහන් කර පිහිටුවා ඇති භාර වේ. ඒ අනුව අවසාන කැමති පත්‍රවල අරමුණු ඉටු කිරීම මේ යටතේ සිදු වන අතර පාසල් සහ විශ්ව විද්‍යාල මෙන්ම අධ්‍යාපනය ලබන දරු දැරියන් වෙත ශිෂ්‍යාධාර ලබා දෙයි.

## 2.4 විදේශ වන්දි

විදේශගතව රැකියාවක නිරත පුද්ගලයෙකු මියයාම හා ආබාධිත වීම වැනි අවස්ථාවලදී ඔහු වෙනුවෙන් ලැබෙන වන්දි මහාභාරකාර දෙපාර්තමේන්තුව වෙත ලැබේ. ඒවා නියමිත උරුමකරුවන් හා යැපෙන්නන් හඳුනා ගෙන ඔවුන්ට ගෙවීම සිදු වේ.මේ ආකාරයට 2022 වර්ෂය තුල රු. 439,589,671.00 ක් ගෙවීම්සිදුකර ඇත.

## 2.5 විභාර වන්දි

1944 අංක 28 දරණ පන්සල් ඉඩම් (වන්දි) ආඥා පනත අනුව සිද්ධස්ථාන සතු ඉඩම් රජයේ කාර්යයන් සඳහා අත්පත් කර ගැනීමේදී ලබා දෙනු ලබන වන්දි මුදල් බෞද්ධ කටයුතු කොමසාරිස් ජනරාල්ගේ හා මහා භාරකාරතැනගේ අනුමැතිය පරිදි ගෙවීම් කිරීම ද මෙම දෙපාර්තමේන්තුව මගින් සිදුවේ. මේ අනුව 2022 වර්ෂය තුල රු.231,391,223.69 ක මුදලක් විභාර වන්දි ලෙස ගෙවීම් කර ඇත.

## 2.6 නෛතික කටයුතු

මෙම දේපළ බුදල් සම්බන්ධව නඩු කටයුතු බහුලව පවතී. කම්කරු විනිශ්චයාධිකරණයේ නඩු 2, මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු 2, දිසාඅධිකරණයේ නඩු 83, සිවිල් අභියාචනා මහාධිකරණයේ නඩු 5, ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු 2, ගොවිජන විනිශ්චයසභාවේ 47 ලෙස දැනට පවතින නඩු සංඛ්‍යාව 141කි. නීති හා විමර්ශන ලෙස වෙනම්ම අංශයක් පිහිටුවා ඊට අදාළ කටයුතු සිදු කරමින් පවතී.

## 2.7 රජයේ ආදායමට මුදල් ප්‍රේෂණය කිරීම

1990 ඔක්තෝම්බර් 08 දිනැති අංක 944/7 දරණ අති විශේෂ ගැසට් පත්‍රය අනුව මූලධන ගාස්තු, ආදායම් ගාස්තු, ආයෝජන ගාස්තු, භාරකාර ගාස්තු, සේවා ගාස්තු, හා දෙපාර්තමේන්තු ගාස්තු ලෙස භාර සහ බුදල්වලින් අය කර රජයේ ගාස්තු මුදල් ලෙස මාසිකව රජයේ ආදායමට බැර කිරීම සිදු කරනු ලබයි. ඒ අනුව 2022 වර්ෂය තුළ රු.18,491,945.84 මුදලක් රජයේ ආදායමට බැර කර ඇත.

ගිහාන් පිළපිටිය.

ශ්‍රී ලංකාවේ මහා භාරකාර තැන.

ගිහාන් පිළපිටිය
ශ්‍රී ලංකාවේ මහා භාරකාරතැන
මහා භාරකාර දෙපාර්තමේන්තුව
අංක 02, බුලර්ස් පටුමග,
කොළඹ 07.

**03 පරිච්ඡේදය -2022** දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ථ මූල්‍ය කාර්ය සාධනය

## 3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය (ඒසීඒ - එෆ්)

| අයවැය 2022 රු. | | සටහන | තත්‍ය 2022 රු. | 2021 රු. | |
|---|---|---|---|---|---|
| - | **ආදායම් ලැබීම්** | | - | - | |
| - | ආදායම් බදු | **1** | - | - | |
| - | දේශීය භාණ්ඩ හා සේවාමත බදු | **2** | - | - | **ඒසීඒ-1** |
| - | ජාත්‍යන්තර වෙළඳාම මතබදු | **3** | - | - | |
| - | බදු නොවන ආදායම් හාවෙනත් | **4** | - | - | |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | - | - | |
| - | **ආදායම් නොවන ලැබීම්** | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 52,076,000 | 50,315,000 | **ඒසීඒ-3** |
| - | තැන්පතු | | 72,465 | 29,309 | **ඒසීඒ-4** |
| - | අත්තිකාරම් ගිණුම් | | 3,754,695 | 3,756,055 | **ඒසීඒ-5** |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | |
| - | **මුළු ආදායම් නොවනලැබීම් (ආ)** | | **55,903,160** | **54,100,364** | |
| - | **මුළු ආදායම් ලැබීම්සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **55,903,160** | **54,100,364** | |
| | **භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)** | | **3,890** | **335,551** | |
| | **ශුද්ධ ආදායම් ලැබීම්සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)** | | **55,899,270** | **53,764,813** | |
| | **අඩු කළා : වියදම්** | | | | |
| - | **පුනරාවර්තන වියදම්** | | - | - | |
| 42,950,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | **5** | 40,839,676 | 38,443,861 | |
| 29,750,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | **6** | 27,243,982 | 23,882,420 | **ඒසීඒ-2(ii)** |
| 300,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | **7** | 198,662 | 223,295 | |
| - | පොළී ගෙවීම් | **8** | - | - | |
| - | වෙනත් පුනරාවර්තනවියදම් | **9** | - | - | |
| 73,000,000 | **මුළු පුනරාවර්තනවියදම් (ඊ)** | | **68,282,320** | **62,549,576** | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | **මූලධන වියදම්** | | | | |
| 1,400,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | **10** | 952,421 | 484,233 | |
| 1,100,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | **11** | 990,565 | 1,420,464 | |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | **12** | - | - | **ඒසිඒ-2(ii)** |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | **13** | - | - | |
| 500,000 | හැකියා වර්ධනය | **14** | 435,318 | 123,900 | |
| - | වෙනත් මූලධන වියදම් | **15** | - | - | |
| 3,000,000 | **මුළු මූලධන වියදම් (උ)** | | **2,378,304** | **2,028,597** | |
| | තැන්පතු ගෙවීම් | | 72,465 | 29,309 | **ඒසිඒ-4** |
| | අත්තිකාරම් ගෙවීම් | | 4,275,325 | 3,987,823 | **ඒසිඒ-5** |
| | වෙනත් ප්‍රධාන ලෙජර්ගිණුම් ගෙවීම් | | - | - | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)** | | **4,347,790** | **4,017,132** | |
| | **මුළු වියදම් එ = (ඊ+උ+ඌ)** | | **75,008,414** | **68,595,305** | |
| 76,000,000 | **දෙසැම්බර් 31 දිනටශේෂය ඒ = (ඉ-එ)** | | **(19,109,144)** | **(14,830,492)** | |
| | **අග්‍රිම සැසඳුම්ප්‍රකාශය අනුව ශේෂය** | | **(19,109,144)** | **(14,830,492)** | **ඒසිඒ-7** |
| | **දෙසැම්බර් 31 දිනටඅග්‍රිම ශේෂය** | | | | **ඒසිඒ-3** |
| | | | **(19,109,144)** | **(14,830,492)** | |

## 3.2 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය (ඒසීඒ -පී)

ඒසීඒ-පී

**2022** දෙසැම්බර් **31** දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | සටහන | තක්‍ය 2022 රු. | 2021 රු. |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 35,511,536 | 34,520,971 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 11,113,875 | 10,593,245 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | - |
| **මුළු වත්කම්** | | **46,625,411** | **45,114,216** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | 11,113,875 | 10,593,245 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 35,511,536 | 34,520,971 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | | |
| **ජංගම වගකීම්** | | | |
| නැන්පතු ගිණුම් | ඒසීඒ-4 | - | - |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | - | - |
| **මුළු වගකීම්** | | **46,625,411** | **45,114,216** |

පිටු අංක 7 සිට 51 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 52 සිට 59 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපිත කිරීම ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ ඝට්ලනාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරි | ගණන්දීමේ නිලධාරි | ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/ |
| නම : | නම : | අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
| තනතුර : | තනතුර : | නම : |
| දිනය : 2023-02-27 | දිනය : 2023-02-22 | දිනය : 2023/02/28 |
| | එම්. නාලිකා පී. ගුණරත්න<br>ශ්‍රී ලංකාවේ මහා භාරකාරතැන (රා.ඉ.)<br>මහා භාරකාර දෙපාර්තමේන්තුව<br>අංක 02, බුල්ර්ස් පටුමග,<br>කොළඹ 07. | එම්. එල්. ඩී. දිල්හාරි<br>ගණකාධිකාරි<br>මහා භාරකාර දෙපාර්තමේන්තුව<br>අංක 02, බුල්ර්ස් පටුමග,<br>කොළඹ 07. |

**3.3 2022දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහාමුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය(ඒසීඒ -සී)**

| | තක්‍ය | |
|---|---|---|
| | **2022** රු. | **2021** රු. |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | - |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | - | - |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 20,770,857 | 14,996,754 |
| අග්‍රිම ලැබීම් | 52,076,000 | 50,315,000 |
| අත්තිකාරම් අයකර ගැනීම් | 3,237,362 | 3,580,443 |
| තැන්පතු ලැබීම් | 72,465 | 29,309 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **76,156,684** | **68,921,506** |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 68,218,360 | 62,540,226 |
| සහනාධාරසහ මාරුකිරීම් | | - |
| වෙනත්වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 1,383,330 | - |
| භාණ්ඩාගාරයටපියවන ලද අග්‍රිම | 3,890 | 335,551 |
| අත්තිකාරම් ගෙවීම් | 4,100,335 | 3,987,823 |
| තැන්පතු ගෙවීම් | 72,465 | 29,309 |
| **මෙහෙයුම්ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **73,778,380** | **66,892,909** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | **2,378,304** | **2,028,597** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| භිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අයකර ගැනීම් | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | **-** | **-** |

| | | |
|---|---|---|
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| භෞතිකවත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් | **2,378,304** | **2,028,597** |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **2,378,304** | **2,028,597** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)** | **(2,378,304)** | **(2,028,597)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල්ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | - | - |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | - | - |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)** | - | - |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | - | - |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | - | - |

**3.4 වාර්තා කිරීමේ පදනම**

1) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2022ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහරවත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩිදියුණු කර ඇත.අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනමමත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලටඉදිරිපත් කර ඇත.

3) ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාවනොසළකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක්ඇති විට හා එමවත්කම් විශ්වාසනීයව මැනියහැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතියඅදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) දේපළ, පිරියතහාඋපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියතහාඋපකරණවල අනුරූප ගිණුම වේ.

6) මුදල් හා මුදල් සමාන දෑ

2022 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහකාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

**3.**5ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය (රු.  ,000)

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතුකරනලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
| 2002.02.99 | පොළිය, අනෙකුත් | 420 | 420 | 468 | 111% |
| 2003.99.00 | විකුණුම් හා ගාස්තු අනෙකුත් ලැබීම් | 8,500 | 8,500 | 18,540 | 218% |

**3.**6වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය (රු.,000)

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදනය | | |
| **පුනරාවර්තන** | 73,000 | 73,000 | 68,282 | 94% |
| **ප්‍රාග්ධන** | 3,000 | 3,000 | 2,378 | 79% |

**3.**7**මු.රෙ. 208 ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන**

රු.  ,000

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| - | - | - | - | - | - | - |

**3.**8මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනයරු.  ,000

| වත්කම් කේතය | කේත විස්තරය | 31.12.2022 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 31.12.2022 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | - | - | - | - |
| 9152 | යන්ත්‍රෝපකරණ | 35,511 | 35,511 | - | 100% |
| 9153 | ඉඩම් | - | - | - | - |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | - | - | - | - |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | - | - | - | - |
| 9160 | කෙරීගෙන යන වැඩ | - | - | - | - |
| 9180 | බදු දෙන ලද වත්කම් | - | - | - | - |

**3.09 විගණකාධිපතිවරයාගේ වාර්තාව**

# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } සිඒඒ/සි/ඩීපීටී/2/2022/03 මගේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2023 මැයි 03 දින

මහා භාරකාර තැන

මහා භාරකාර දෙපාර්තමේන්තුව

**ශීර්ෂය 205 - මහා භාරකාර දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂය 205 - මහා භාරකාර දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මහා භාරකාර දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට මහා භාරකාර දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ

තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම් හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාල වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|
| 2.3 (ඇ) | අධිකරණ අමාත්‍යාංශය විසින් 2019 වර්ෂයේදී දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබූ වාහන 03 ක වටිනාකම තක්සේරු කර මූල්‍ය නොවන වත්කම්වලට ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි. | 1.6.1 |

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය නොවන වත්කම්

අධිකරණ අමාත්‍යාංශය විසින් 2019 වර්ෂයේදී දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබූ වාහන 03 ක වටිනාකම තක්සේරු කර මූල්‍ය නොවන වත්කම්වලට ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි.

### 1.6.2 දේපල, පිරියත හා උපකරණ සංචිතය

පූර්ව වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තා මඟින් අපහරණය කිරීම සඳහා නිර්දේශ කරන ලද ලී බඩු උපකරණ, පරිගණක උපකරණ හා කාර්යාල උපකරණ ඇතුළු අයිතම 10ක පිරිවැය හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල දේපල, පිරියත හා උපකරණ ශේෂයෙන් අඩුකර දැක්වීමට කටයුතු කර නොතිබුණි.

1.6.3 **ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් ඇප තැබිය යුතු නිලධාරීන් සම්බන්ධයෙන් ඇප ලේඛනයක් පවත්වා නොතිබුණි.

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **ආදායම් කළමනාකරණය**

2022 ක්‍රියාකාරී සැලැස්ම අනුව භාර හා බුදල්වලට අදාලව මහා භාරකාර ආඥා පනත යටතේ අය කරන ලද මුලධන, ආයෝජන ආදායම් ගාස්තු හා වෙනත් ගාස්තු ලෙස රු.8,500,000 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබූ අතර රු.19,214,500 ක ආදායමක් රැස් කර තිබූ බව 2023 මාර්තු 10 දිනැති හා අංක PT/2/CA/3/3/5/2/(II) වෙළුම ලිපිය අනුව නිරීක්ෂණය විය. එය ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස 226% කි. ඒ අනුව ඇස්තමේන්තු කිරීමේ දුර්වලතාවයක් නිරීක්ෂණය විය.

2.2 **වියදම් කළමනාකරණය**

205-01-1-2001 යටතේ ගොඩනැගිලි සහ ඉදිකිරීම් වෙනුවෙන් ලබා ගෙන තිබූ රු.300,000 ක ප්‍රතිපාදන මුදලින් සියයට 63 ක ප්‍රමාණයක් භාවිතා නොකර ඉතිරි කර තිබුණි.

2.3 **ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) වාර්ෂික සහ වෙනත් මූල්‍ය ප්‍රකාශ අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු අතර, ඊට අමතරව විගණනය කරනු ලබන ආස්ථාපනයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වගබලාගත යුතු වුවත්, වාර්තාවේ 3.1.1 (අ) ඡේදයේ සඳහන් විගණන නිරීක්ෂණ හේතුවෙන් එම අවශ්‍යතා ඉටු කර නොතිබුණි.

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1922 අංක 01 දරන මහා භාරකාර ආඥා පනතේ 47(1) වගන්තිය | භාර/බූදල් ගිණුම් වාර්ෂිකව විගණනය කළ යුතු වුවත් 2021 වර්ෂයේ ගිණුම්වලින් කොටසක් හා 2022 වර්ෂය සඳහා පිළියෙල කරන ලද භාර/ බූදල් අවසාන ගිණුම් මෙම වාර්තාවේ දිනය වන විටත් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.3 වගන්තිය | ඉන්ධන භාවිතයේ අහිතකර වෙනසක් ඇත්නම් එය හඳුනා ගැනීම සඳහා චක්‍රලේඛයෙහි ඇමුණුම 01හි දක්වා ඇති පරිදි ප්‍රවාහන සේවා සටහන මාසිකව සම්පූර්ණ කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 2015 ජූලි 14 දිනැති අංක 4/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 02 ඡේදය | වෙළඳපොල තුළ ක්‍රියාත්මක ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ ලියාපදිංචි රජය සතු ආයතන වෙතින් මිල ගණන් කැඳවීම තුළින් රක්ෂණ ආවරණයක් සලසා ගත යුතු වුවත් දෙපාර්තමේන්තුව සතු වාහන සඳහා මිල ගණන් කැඳවීමකින් තොරව සෘජුවම ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් රක්ෂණ සේවාවන් ලබා ගැනීමට කටයුතු කර තිබුණි. |
| (ඈ) | 2016 මාර්තු 31 දිනැති අංක 5/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1.6 ඡේදය | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කර එම වාර්තාව ඉදිරි වර්ෂයේ මාර්තු 31 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2021 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තා මාස 03 ක කාල ප්‍රමාදයකින් පසුව 2022 ජූලි 21 දින විගණනය වෙත ඉදිරිපත් කර තිබූ අතර දෙපාර්තමේන්තුව විසින් පාලනය කරන වතු 11 ට අදාළව භාණ්ඩ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. |
| (ඉ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 11.1 ඡේදය | භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල පත් කිරීම අදාළ මුදල් වර්ෂයේ දෙසැම්බර් 15 දිනට ප්‍රථම සිදු කළ යුතු වුවත් 2021 හා 2022 වර්ෂයන්ට අදාළව භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල පත් කිරීම අදාළ කාල රාමුව තුළ සිදු කර නොතිබූ බව නිරීක්ෂණය විය. |

2.5 බැංකු ගිණුම් මෙහෙයවීම

දෙපාර්තමේන්තුව විසින් පවත්වා ගෙන යනු ලබන පොදු ජංගම ගිණුමේ වර්ෂ කිහිපයක සිට හඳුනා නොගත් සෘජු ලැබීම් පවතින බව නිරීක්ෂණය වූ අතර 2023 පෙබරවාරි 28 දිනට පිළියෙල කරන ලද බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව හඳුනා නොගත් සෘජු ලැබීම් එකතුව රු.2,719,188 ක් විය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව

(අ) 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 වගන්තිය ප්‍රකාරව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කර පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත් 2021 වර්ෂයට අදාල වාර්ෂික කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට ඉදිරිපත් කර තිබුණේ 2022 නොවැම්බර් 16 දින වේ.

(ආ) දෙපාර්තමේන්තුව විසින් හඳුනාගෙන ඇති කාර්යසාධන දර්ශක 10 න් 03 ක තත්‍ය නිමැවුම, අපේක්ෂිත නිමැවුමෙන් සියයට 50 ට වඩා අඩු මට්ටමක පැවතුණු අතර වතු කළමනාකරණ අංශයේ අපේක්ෂිත නිමැවුම සියයට 54 ක ඍණ අගයක් ගෙන තිබුණි.

3.2 වත්කම් කළමනාකරණය

(අ) විවිධ බූදලයන් යටතේ පවරා දෙන ලද වතු දේපළ 11 ක් 2022 වර්ෂය අවසානය වන විට මහා භාරකාරතැන විසින් කළමනාකරණය කරමින් පැවති අතර එම දේපළ විධිමත්ව කළමනාකරණය කර ඒවායේ ආදායමින් ස්ථාපකගේ අරමුණු ඉටුකිරීම අපේක්ෂා කෙරේ. එසේ වුවද, මෙම වතුවල ආදායම් වැඩිකර ගැනීම තුළින් අදාල බූදල් හිමිකරුවන්ගේ අරමුණු ඉටුකිරීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොමැති බව නිරීක්ෂණය වන අතර සමාලෝචිත වර්ෂයේ වතුවල සමස්ත ශුද්ධ ලාභය රු.2,526,485 ක් බවට පත්ව තිබුණි.

(ආ) සම්පූර්ණ භූමි ප්‍රමාණය අක්කර 17 ක් වූ හැරි හපුගොඩ බූදලයට අයත් ගාල්ල නියාගම ප්‍රදේශයේ මත්තක වත්ත නමැති ඉඩමෙහි අක්කර 1 රූඩ් 1 පර්චස් 2 ක භූමි ප්‍රමාණයක් නිශ්චිතව හඳුනාගෙන ආරක්ෂිත මායිම් නිරවුල් කරගැනීමටත් ආරක්ෂිත වැට ඉදිකර කෘෂිකාර්මික කටයුත්තක් සඳහා යොදවා ගැනීමටත් කටයුතු කර නොතිබුණි.

(ඇ) හැරි හපුගොඩ බූදලයට අයත් සුදුවැලිපොත වත්තෙහි අන්කුදුව නමැති බිම කොටසෙහි අක්කර 13.5 ක පමණ රබර් වගාකළ ඉඩමෙහි නැවත පැළ වගාවන් සිදු කළ යුතුව පවතින බව නිරීක්ෂණය විය. මෙම වත්තෙහි පවතින අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් ද දෙපාර්තමේන්තුව විසින් නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. තවද, ඉහත සඳහන් වත්තෙහි පිහිටි වතු බංගලාව කඩිනමින් පිළිසකර කිරීමක් අවශ්‍ය බවද නිරීක්ෂණය විය.

(ඇ) එන්. ඩී. එස්. සිල්වා විජේසිංහ බුදලයට අයත් කලුතර දිස්ත්‍රික්කයෙහි පිහිටි රිච්මන්ඩ මන්දිරය වර්ෂ 100 කට අධික ඉතිහාසයක් සහිත පෞරාණික වැදගත්කමකින් හෙබි මන්දිරයක් බැවින් කඩිනමින් සංරක්ෂණය කිරීමේ අවශ්‍යතාවයක් පවතින බව නිරීක්ෂණය විය. තවද, ඉහත සඳහන් බුදල්කරුගේ අන්තිම කැමති පත්‍රයෙහි පෞරාණික වටිනාකමකින් යුත් කෞතුක භාණ්ඩ ලැයිස්තුවක් සඳහන් කර තිබූ අතර එම කෞතුක භාණ්ඩ ඉහත සඳහන් මන්දිරයෙහි තැන්පත් කර සංරක්ෂණය කළ යුතු බව සඳහන් කර තිබුණි. එසේ වුවද එම කෞතුක භාණ්ඩ අතරින් කෞතුක භාණ්ඩ කිහිපයක් පමණක් දෙපාර්තමේන්තුවේ සේප්පුවක තබා ඇති බවත් අනෙකුත් කෞතුක භාණ්ඩ පවතින ස්ථානය පිළිබඳව සොයා බැලීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබූ බවත් නිරීක්ෂණය විය.

(ඉ) අයි. ඩබ්ලිව්. සී. වීජේරත්න බුදලයට අයත් නෝර්ටන් බ්‍රිජ්හි පිහිටි නිවස හා ඉඩම 1993 දෙසැම්බර් 07 දින වැඩිහිටි නිවාසයක් පවත්වා ගෙන යෑම සඳහා ගිනිගත්හේන ප්‍රාදේශීය ලේකඵ කාර්යාලය වෙත භාරදී තිබුණි. එහෙත්, බුදලයට අයත් නිශ්චල දේපළ, වෙනත් පාර්ශවයක් වෙත ලබාදීමේදී නිවස භාරදීම හා නඩත්තු කිරීම යනාදී කරුණු පිළිබඳව විධිමත් පරිදි එකඟතාවයක් ඇතිකර ගැනීම සඳහා ගිවිසුමකට එළඹිය යුතු වුවත් වර්ෂ 29 ක් ගත වී තිබුණද, විධිමත් ගිවිසුමකට එළඹ නොතිබුණි.

(ඊ) සී. ඊ. වනිගසූරිය බුදලයට අයත් දේපළ විකුණා බුදල්කරුගේ නමින් භාරයක් පිහිටුවීම සඳහා මහා භාරකාරතැන වෙත 2005 නොවැම්බර් 10 දින අද්මිනිස්ත්‍රාසි බලතල ලැබී තිබුණි. එසේ වුවද, එම බුදලයට අයත් ඇතැම් දේපල විකිණීමට කටයුතු කර තිබුණද සෙසු දේපලවල හිමිකාරීත්වය හඳුනා ගෙන මහා භාරකාරතැනගේ අයිතිය තහවුරු වන පරිදි ආරක්ෂා කිරීමටත් එම දේපළ විකුණා බුදල්කරුගේ අරමුණු ඉටුකිරීමටත් කටයුතු කර නොතිබුණි.

### 3.3 රජයේ නිලධාරීන් ඇප කැබීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව, රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතේ 612 වන අධිකාරිය අනුව ඇප තැබිය යුතු නිලධාරීන්ගෙන් ඇප අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 3.4 පාඩු හා හානි

2007 ජනවාරි 27 දින අංක 65 - 0763 දරන වාහනයට අදාලව සිදු වූ අනතුර සම්බන්ධයෙන් වූ රු. 254,038 ක අලාභය, අදාල රියැදුරුගෙන් අයකර ගැනීම සඳහා අධිකරණයේ පවරා තිබූ නඩුව සම්බන්ධව පසු විපරම් සිදු නොකිරීම හේතුවෙන් කාලාවරෝධය මත නිෂ්ප්‍රභ වී තිබූ අතර අනතුර සිදු වී වසර 15 ක් ගත වුවද අදාල පාඩුව වගකිව යුතු අයගෙන් අය කර ගෙන පොත්වලින් කපා හැරීමට සුදුසු පියවර ගෙන නොතිබුණි.

### 3.5 කළමනාකරණ දුර්වලතා

(අ) ඩී. එස්. ඩබ්ලිව්. සමරකෝන් බුදලයට අයත් සයිමන්ඩෙල්වත්ත ඉඩමෙහි රජයට පවරාගෙන තිබුණු අක්කර 16 රූඩ් 01 පර්චස් 35ක් වෙනුවෙන් තීරණය වූ වන්දි මුදල සම්බන්ධයෙන් කැස්බෑව ප්‍රාදේශීය ලේකම් විසින් අවස්ථා දෙකකදී පිළිවෙලින් රු. මිලියන 2.03 ක් සහ රු. මිලියන 1.79 ක් බව දැනුම් දී තිබුණද අදාල වෙනස නිරවුල්

කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග මෙම වාර්තාවේ දිනය වන විටත් ගෙන නොතිබුණි.

(ආ) 1968 අගෝස්තු 11 දින සිංගප්පුරුවේදී මියගිය ෆ්ලොරන්ස් ඊනිඩ් විදම් මහත්මියගේ ශ්‍රී ලංකාවේ පැවති නිශ්චල හා චංචල දේපළ විකුණා ලැබෙන මුදල් උරුමකරුවන්ට/ අර්ථලාභීන්ට ලබාදීම සඳහා ඇටර්නි බලකරු ලෙස මහා භාරකාරවරයා පත්කර තිබූ අතර දේපල විකිණීමෙන් ලද රු. 64,645,776 ක මුදලින් උරුමකරුවන්/ අර්ථලාභීන් 30 දෙනෙකුට රු.35,880,064 ක මුදලක් ලබාදී තිබුණද 16 දෙනෙකු වෙත ලබා දිය යුතුව පවතින රු. 28,765,712 ක මුදල, දේපළ විකුණා වර්ෂ 23 ක කාලයක් ගත වී තිබුණද ලබා දීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ආර්. එල්. එච්. චන්ද්‍රසේකර යන අයගේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ, පොකානේගම පිහිටි ඉඩම සම්බන්ධයෙන් ගොනු කර තිබූ නඩුවෙන් මහා භාරකාරතැන වෙත හිමිව තිබූ ගොඩ ඉඩමේ පර්චස් 30 ක් සහ කුඹුරු ඉඩම් අක්කර 0.5 ක් සඳහා තාවකාලික භාරකරුවෙකු පත් කර තිබුණද විධිමත් බදු ගිවිසුමකට එලඹීමට මෙම වාර්තාවේ දින වන විටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. තවද, නිශ්චිත ව්ශයෙන්ම අඳ ගොවියා විසින් වගාකළ **කුඹුරු** ප්‍රමාණය, ගොඩ ඉඩම් ප්‍රමාණය සහ ඉන් ලද අස්වැන්න සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් අධීක්ෂණය හෝ පසු විපරම් කර නොතිබුණු බවත් අඳ ගොවියා විසින් ඔහුගේ කැමැත්ත පරිදි ගෙවන ප්‍රවේණිය පමණක් භාරගෙන ගිණුම්ගත කර තිබූ බවත් නිරීක්ෂණය කෙරේ.

(ඈ) 2013 වර්ෂය දක්වා ඵලදායී අයුරින් කළමනාකරණය කර නොතිබුණු වීරසිංහ අබේනායක බුදලයට අයත් මාතර ගබඩා වීදියේ පර්චස් 32 ක් විශාල ඉඩම හා ගොඩනැඟිල්ල 2013 පෙබරවාරි 05 දින රු. 8,000 ක මාසික කුළියකට බදු දී තිබූ අතර බදු ගිවිසුම 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වී තිබුණි. මෙම දේපළ විකිණීම සඳහා නඩු අංක 97/16 යටතේ 2016 සැප්තැම්බර් 29 දින කොළඹ දිසා අධිකරණයේ දිසා විනිසුරුවරයාගේ අවසරය ලබාගෙන තිබුණද දේපළ විකුණා අරමුදලට බැර කිරීම වෙනුවට විධිමත් බදු ගිවිසුමකට එළඹීමෙන් තොරව ඉහත බදුකරුටම මාසිකව රු.10,000 ක මුදලකට බදු දී තිබුණි.

(ඉ) ඩී. ජේ. ඩී. ජේ. අබේසේකර බුදලයට අයත් ගාල්ල ඇල්පිටිය ප්‍රදේශයෙහි පිහිටි කඩකාමරයක් හා ඉඩමක් වසර 20කට වැඩි කාලයක සිට ගිවිසුම්වලින් තොරව බදු දී තිබූ අතර රු. 1,100,000 ක් ලෙස තක්සේරු කරන ලද මෙම කඩ කාමරය වෙනුවෙන් 2018 මැයි දක්වා රු. 227,380 ක් ද, ඉඩම සඳහා 2005 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා රු. 143,400 ක් ද වශයෙන් බදු කුලී අයවිය යුතු බව ගණනය කර තිබුණද බදු කුලී අයකර ගැනීමට මෙම වාර්තාවේ දිනය වන විටත් අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(ඊ) නුගේගොඩ ප්‍රදේශයේ පදිංචිව සිටි ජී. එස්. ජයසූරිය නැමැති අයගේ බුදලය සම්බන්ධයෙන් වූ අද්මිනිස්ත්‍රාසි බලතල 1982 වර්ෂයේදී මහා භාරකාරතැන වෙත ලැබී තිබුණු අතර බුදල්කරුගේ නැසීගිය පළමු බිරිඳට අයත්ව තිබූ ඉඩමක් 1999 වර්ෂයේදී රජයට පවරාගෙන තිබුණි. එමෙන්ම ඇයගේ අන්තිම කැමති පත්‍රයෙහි සඳහන් කොන්දේසි ප්‍රකාරව එම ඉඩම සඳහා බුදල්කරුට හිමිකමක් නොතිබුණි. එසේ වුවද,එම ඉඩම සඳහා නඩුවක් පවරා වන්දි හිමිකම් ඉල්ලුම් කර 2000 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා නීතිඥ ගාස්තු ලෙස රු.2,962,430 ක වියදමක් දරා තිබුණි. 2019 ඔක්තෝබර් 23 දින ලද අංක 522/08/විශේෂ දරන එම පාසුවේ නියෝගය ප්‍රකාරව එකී වද්දලට අදාලව

වන්දි හිමිකමක් නොමැති බව තීන්දු කර තිබුණි. එබැවින්, හිමිකමක් නොමැති දේපළක් වෙනුවෙන් අනවශ්‍ය ලෙස කාලය හා අරමුදල් වැය කර තිබූ අතර තවදුරටත් නීතිඥ ගාස්තු ගෙවිය යුතුව පවතින බවත් නිරීක්ෂණය විය.

(උ) හැරී හපුගොඩ මහතාගේ අන්තිම කැමති පත්‍රය ප්‍රකාරව සෑම වසරකදීම බූදලයේ ආදායමින් 1/5 ක් ඉතිරි කළ යුතු බවත් එම ඉතිරිය රු. 100,000 ක් වූ විට එය ශිෂ්‍යාධාර පිරිනැමීමට හා ආපදා තත්වයන්හිදී සහන සැලසීමට රැස් කර තැබිය යුතු බවත් දක්වා තිබුණි. එසේ වුවත් එම අරමුණු ඉටු කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් ආදායම් ඉතිරි කර නොතිබුණි. 2015 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වූ වර්ෂ 5 ක කාලය තුළ රු.24,865,439 ක ආදායම් උපයා තිබුණු අතර එයින් රු. 4,973,088 ක් ඉතිරි කළ යුතු වුවත් එසේ ඉතිරි කර නොතිබුණි. වතු සම්බන්ධයෙන් නිසි කළමනාකරණයකින් යුක්තව කටයුතු නොකිරීම හේතුවෙන් වර්තමානයේ අදාල වතුවල හර ශේෂයක් පවතින බවත් ඒ හේතුවෙන් බූදලයට අදාල අරමුණු ඉටු කිරීමට නොහැකිව ඇති බවත් නිරීක්ෂණය විය.

(ඌ) විවෘත නොකරන ලද අන්තිම කැමති පත්‍ර 254 විවෘත කිරීම් සම්බන්ධයෙන් වූ නීති කටයුතු වෙනුවෙන් රු.2,629,250 ක් වැය කර තිබුණු අතර එම් වියදම් ඩී. එස්. ඩබ්. සමරකෝන් බූදලයේ අරමුදල් භාවිත කර ගෙවා තිබුණි. එම බූදලයට අදාලව ඉටුකළ යුතු කාර්යයන් බූදල්කරු විසින් සිය අන්තිම කැමති පත්‍රයෙහි නිශ්චිතව සඳහන් කර තිබූ බැවින් මෙම වියදම් දැර්ම බූදල්කරුගේ අරමුණුවලට පටහැනි බව නිරීක්ෂණය කෙරේ.

(එ) 2021 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බැංකු ශේෂ එකතුව රු. 14,950,471 ක හර ශේෂයක් ඇතිවන පරිදි හාර/බූදල් 10 ක් සම්බන්ධයෙන් වියදම් දරා තිබුණු අතර, ඉන් හාර/බූදල් 6 කට අදාලව එකතුව රු. 1,325,505 ක් වූ හර ශේෂයන් පියවීම සඳහා එම බූදල්වල ආයෝජන කිසිවක් නොවීය.

(ඒ) හාර සහ බූදල් අයත් අංශවලට වෙන් වෙන් වශයෙන් ස්ථාවර වත්කම් ලේඛන නඩත්තු කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඔ) හාර සහ බූදල්වලට අයත් ස්ථාවර වත්කම් ක්ෂය කිරීමට මෙම වාර්තාවේ දිනය වන විටත් කටයුතු කර නොතිබුණි.

## 4. තිරසාර සංවර්ධනය

### 4.1 තිරසර සංවර්ධන අරමුණු ඉටු කිරීමේ ප්‍රගතිය

දෙපාර්තමේන්තුව විසින් තිරසර සංවර්ධන අරමුණු 05 ක් හඳුනාගෙන තිබුණු අතර, ඉන් සෞඛ්‍ය ප්‍රවර්ධනය සහ භෞමික පරිසර පද්ධතිය ආරක්ෂා කර ගැනීම යන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධනය පිටුවෙලින් සියයට 24 ක් හා සියයට 47 ක් දක්වා වූ අඩු මට්ටමක පැවතුණි.

## 5. මානව සම්පත් කළමනාකරණය

### 5.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය සහ තථ්‍ය කාර්ය මණ්ඩලය

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය 87 ක් වුවද තථ්‍ය කාර්ය මණ්ඩලය 67 ක් විය. ඒ අනුව නිලධාරීන් 19 දෙනෙකුගේ පුරප්පාඩු පැවති අතර 2015 වසරේ සිට භාෂා පරිවර්තක තනතුර පුරප්පාඩුව පවතින බව නිරීක්ෂණය විය.

(ආ) 2001 අගෝස්තු 22 දිනැති අංක 18/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව, වර්ෂ 5 එකම සේවා ස්ථානයෙහි සේවය කර ඇති සෑම නිලධාරියෙකුටම වෙනත් සේවා ස්ථානවල සේවය කිරීමට ඉඩදීම සඳහා ස්ථාන මාරු ලබා දිය යුතු වුවත්, දෙපාර්තමේන්තුව තුළ වර්ෂ 5 ඉක්ම වූ නිලධාරීන් 18 දෙනෙකු සඳහා ස්ථාන මාරුවීම් ලබා දීමට කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

එච්.එම්.රණසිංහ බණ්ඩා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

**04 පරිච්ඡේදය – කාර්ය සාධන දර්ශක**

**ආයතනයේකාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)**

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | | |
|---|---|---|---|---|
| | **100%- 90%** | **75%-89%** | **50%- 74%** | **50%** අඩු |
| 1.ශිෂ්‍යාධාර ගෙවීම | - | - | 70% | - |
| 2.වෛද්‍යාධාර ගෙවීම | - | - | - | 24% |
| 3.ආගමික සිද්ධස්ථාන නඩත්තුව හා සංවර්ධනය සඳහා ගෙවීම | - | - | 67% | - |
| 4.පුණ්‍යාධාර ගෙවීම | - | - | - | 47% |
| 5. අසරණාධාර ගෙවීම | - | - | 72% | - |
| 6.පුද්ගල භාර ගෙවීම් | - | - | - | 49% |
| 7.භාර අරමුණු අනුව වෙනත් ගෙවීම් | - | - | 62% | - |
| 8. විහාර වන්දි නිදහස් කිරීම | - | 85% | - | - |
| 9. විදේශ වන්දි නිදහස් කිරීම | - | 83% | - | - |
| 10.වතු කළමනාකරණය | | | | (54%) |

**05 පරිච්ඡේදය - තිරසර සංවර්ධනඅරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය**

**5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු දක්වන්න.**

| ඉලක්කය / අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | **0%- 49%** | **50%- 74%** | **75%- 100%** |
| සමානාත්ම ගුණාත්ම අධ්‍යාපනය | ශිෂ්‍යත්වලාභීන් සඳහා ශිෂ්‍යාධාර ලබා දීම | ශිෂ්‍යත්වලාභීන් සංඛ්‍යාව | - | 70% | - |
| සෞඛ්‍ය ප්‍රවර්ධනය | රෝගීන් සඳහා ආධාර ලබා දීම | රෝගීන් සංඛ්‍යාව | 24% | - | - |
| භෞමික පරිසර පද්ධතිය ආරක්ෂා කර ගැනීම | පුණ්‍යාධාර ගෙවීම් | පුණ්‍යාධාරලාභීන් සංඛ්‍යාව | 47% | - | - |
| දරිද්‍රතාවය අවසන් කිරීම | අසරණාධාර ගෙවීම් | අසරණාධාරලාභීන් සංඛ්‍යාව | - | 72% | - |
| සාමකාමී සාධාරණ ආයතන බිහි කිරීම | ආයතන වලට හා සිද්ධස්ථාන සඳහා ආධාර ලබා දීම | ආගමික සිද්ධස්ථාන සංඛ්‍යාව | - | 67% | - |

**5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.**

## 06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

### 06.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු / (අතිරික්ත)** |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 07 | 06 (ම.හා -රා.ආ) | 01 |
| තෘතියික | 02 | 01(වැ.බ) | 01 |
| ද්විතියික | 61 | 46 | 15 |
| ප්‍රාථමික | 17 | 14 | 03 |

### 06.2 **ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න

මෙම දෙපාර්තමේන්තුවේ කාර්යභාරය තුළ භාරබූදල් කළමනාකරණය ප්‍රධාන කාර්යයක් වන අතර ඒ වෙනුවෙන් වන නෛතික කාර්යය රාශියක් පවතින බැවින් ජෙෂ්ඨ මට්ටමේ තනතුරක් වන නීති නිලධාරී තනතුර සඳහා නිලධාරියෙකු බඳවා ගැනීමට නොහැකිවීම කාර්යය සාධනය කෙරෙහි සෘජුවම බලපා ඇත. එමෙන්ම තෘතීය තනතුරු හා ද්විතීය තනතුරු වල පුරප්පාඩු අතුරෙන් බහුතරය ඒකාබද්ධ සේවාවට අයත් නතුරු පුරප්පාඩු වන බැවින් ඒ සඳහා නිලධාරීන් ලබාගැනීමට නොහැකිවීම ගැටලුවක්ව පවතී.

නමුත් සිටින කාර්යමණ්ඩලය ප්‍රශස්ත අයුරින් යොදවා ගනිමින් දෙපාර්තමේන්තු ඉලක්ක සපුරා ගැනීමට වර්ෂය තුළදී උපරිම උත්සාහයක් ගෙන ඇත.

**06.3** මානව සම්පත් සංවර්ධනය

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩ සටහනේ කාල සීමාව | සමස්ථ ආයෝජනය (Rs'000) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමැවුම/ ලබාගත් දැනුම* |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් සකස් කිරීම | 14 | දින 2 | 70 | | දේශීය | වැටුප් සකස් කිරීම පිළිබඳ දැනුම |
| නීතිය පිළිබඳ පශ්චාත් උපාධිය | 01 | | 300 | | දේශීය | නීතිය පිළිබඳ දැනුම |

**07 පරිච්ඡේදය – අනුකූලතා වාර්තාව**

| අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 1 | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුමේ නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | - | - |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | - | - |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අදාල නොවේ | - | - |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අදාල නොවේ | - | - |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අදාල නොවේ | - | - |
| 1.6 | වෙනත් | අදාල නොවේ | - | - |
| 2 | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | - | - |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 03 | **මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම | අනුකූල වේ | - | - |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම | අනුකූල වේ | - | - |
| 3.4 | 2014.05.11 දැනති අංක 171/2004 දරණරාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම. | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 4 | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | - | - |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 5 | **විගතණනවිමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල වේ | - | - |
| 6 | **අභයන්තරවිගණනය** | | | |
| 6.1 | මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ | - | - |
| 6.3 | 2018 අංක 19 දරණජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 7 | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMAචක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණකමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල වේ | | |
| 8 | **වත්කම්කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණවත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමසම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම | අනුකූල වේ | - | - |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල වේ | - | - |
| 8.5 | ගර්හිතභාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 9 | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | - | - |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම | අනුකූල වේ | - | - |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | - | - |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණරාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම් නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | - | - |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම | අදාල නොවේ | - | - |
| 10 | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ | - | - |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | - | - |
| 11 | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | - | - |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එලඹීම | අනුකූල වේ | - | - |
| 12 | **රජයේනිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන්වලට අනුකූල වීම | අනුකූල වේ | - | - |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම | අනුකූල වේ | - | - |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල වේ | - | - |
| 13 | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූල වේ | - | - |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 14 | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | - | - |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | - | - |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | - | - |
| 15 | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කර තිබීම | අදාල නොවේ | - | - |
| 15.2 | රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම | අදාල නොවේ | - | - |
| 15.3 | මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අදාල නොවේ | - | - |
| 16 | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම | අනුකූල වේ | - | - |
| 16.3 | 20.09.2017දිනැතිMSDචක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 17 | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ | - | - |
| 17.3 | තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | - | - |

| | | | | |
|---|---|---|---|---|
| 18 | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණරාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල වේ | - | - |
| 18.2 | එම චක්‍රලේඛ 2.3 ඡේදයපරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල වේ | - | - |
| 19 | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූල වේ | - | - |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම. | අනුකූල වේ | - | - |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ අමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල වේ | - | - |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම | අනුකූල වේ | - | - |
| 20 | **විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | - | - |

**අවසානය.**